අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/12/01/19/2/5 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2023.01.02

සියලුම අතිරේක ලේකම්වරුන්,
ප්‍රධාන මූල්‍ය නිලධාරිවරුන්,
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්),
ලේකම් ජනරාල්, ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

<u>අධ්‍යාපන අමාත්‍යාංශයේ අංශ/ශාඛා අතර ස්ථාන මාරුවීම් - 2023</u>

මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරය වැඩි කාර්යක්ෂමතාවයකින් යුක්තව ඉටු කරලීම පිණිසත්, නිලධාරීන් වෙත විවිධ අංශ මඟින් ඉටු කරනු ලබන කටයුතු පිළිබඳ විෂය පරිචයක් ලබා දීම සඳහාත්, අමාත්‍යාංශයේ අංශ/ශාඛා අතර නිලධාරීන් ස්ථාන මාරු කිරීමට තීරණය කර ඇත.

**02. අංශ/ශාඛා අතර ස්ථානමාරුවීම් සඳහා යටත් වන නිලධාරීන්**

2.1 ඒකාබද්ධ/ඒකාබද්ධ නොවන සේවයන්ට අයත් මෙම අමාත්‍යාංශයේ සේවය කරන පහත සඳහන් තනතුරුවල නිලධාරීන් අංශ/ශාඛා අතර ස්ථාන මාරුවලට යටත් වේ.

I. සංවර්ධන නිලධාරි සේවය ( III,II,I ශ්‍රේණි)
II. සංවර්ධන සහකාර/මූල්‍ය සහකාර
III. කළමනාකරණ සේවා නිලධාරි සේවය ( III,II,I ශ්‍රේණි)
IV. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (3 පන්තියේ III/II)
V. ලේඛන සහකාර
VI. කාර්යාල සේවක සේවය ( III,II,I ශ්‍රේණි)

**03. ඉහත සඳහන් පරිදි අංශ/ශාඛා අතර ස්ථාන මාරු කිරීමේදී පහත සඳහන් ක්‍රමවේදය අනුව කටයුතු කිරීමට නියමිතව ඇත.**

I. දැනට සේවය කරනු ලබන අංශයේ/ශාඛාවේ වසර 02කට වඩා වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ට මෙම ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කළ හැකි අතර ශාඛාවේ සේවා කාලය වසර 03කට වඩා වැඩි නිලධාරීන් මෙම ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
II. <u>2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් සහ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලද හෝ වෙනත් ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධාරීන් මෙම අංශ/ශාඛා අතර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් නොකළ යුතුය.</u>
III. එක් අංශයකින්/ශාඛාවකින් වැඩි නිලධාරීන් පිරිසක් ස්ථාන මාරු අයදුම් කර ඇතිවිට අංශය/ශාඛාව තුළ වැඩි සේවා කාලයක් සහිත නිලධරයන්ට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.
IV. යම් අංශයකට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇතිවිට අමාත්‍යාංශය තුළ වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන්ට ප්‍රමුඛතාවය හිමි වේ.
V. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී අංශයේ/ශාඛාවේ සේවා අවශ්‍යතාවයන්ද අංශවලින්/ශාඛාවලින් ඉටු කරන කාර්යභාරය අඛණ්ඩව පවත්වා ගැනීමට හැකිවන පරිදි ද, අංශවල/ශාඛාවල කාර්ය මණ්ඩල කණිෂ්ඨ,ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකගැනීමට හැකිවන පරිදි ද, කටයුතු කිරීමට හැමවිටම උත්සාහ කළ යුතුය.

VI. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේ නම්, අංශ/ශාඛා අතර ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන නිලධාරීන්ගෙන් එසේ කටයුතු නොකිරීමට හේතු විමසනු ලැබේ.

VII. අංශ/ශාඛා අතර ස්ථාන මාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරුවීම් ලබා දීමේ ගැටළු පැන නැඟී ඇත්නම් සමාලෝචන කමිටුවට එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබා දීමේ හැකියාව ඇති අතර එවැනි නිලධාරීන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

**04. සේවා කාලය ගණනය කිරීම**

I. අංශ/ශාඛා අතර ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනටය. (උදා:- 2023 අංශ/ශාඛා අතර ස්ථාන මාරුවීම් සඳහා 2022.12.31 දිනය.)

II. සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස නිලධාරියා එම අංශයේ සේවයට වාර්තා කළ දිනය සලකනු ලැබේ.

III. සංවර්ධන නිලධාරීන් සඳහා උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස නියමිත පුහුණුව අවසන් කිරීමෙන් පසු සංවර්ධන නිලධාරි සේවයේ තනතුරකට පත්වීම් ලබා දුන් දිනය ඔවුන්ගේ පත්වීම් දිනය ලෙස සලකා ස්ථාන මාරු අයදුම්පත් සකස් කළ යුතුය.

**05. අංශ/ශාඛා අතර ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

5.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ලෙස මවිසින් පිහිටවනු ලබන අංශ/ශාඛා අතර ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| I. | සුභාෂිණී කුලතුංගමුදලි මිය | - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා) |
| II. | ඩී.එන්.ජේ. ගමගේ මිය | - සහකාර ලේකම් (ගුරු ආයතන) |
| III. | කේ.ජී.එස්.පී. වීරකෝන් මයා | - ප්‍රධාන ගණකාධිකාරි (ප්‍රසම්පාදන) |
| IV. | රසිකා සිල්වා මිය | - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන) |
| V. | ලක්ෂ්මී ඕකන්දපොල මිය | - පරිපාලන නිලධාරි (අධ්‍යාපන සේවා) |

**06. අංශ/ශාඛා අතර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

6.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ලෙස මවිසින් පිහිටුවනු ලබන ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| I. | ආර්.බී. ගන්කේවල මිය | - අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) |
| II. | සුභාෂිණී කුලතුංගමුදලි මිය | - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා) |
| III. | උදාරා ටී. දික්කුඹුර මිය | - අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) |

**07. අංශ/ශාඛා අතර ස්ථාන මාරුවීම් සඳහා ක්‍රියාත්මක දිනය වන්නේ 2023.04.03 දිනය.**

**08.** අංශ/ශාඛා අතර ස්ථාන මාරු කාල සටහන

| | |
|---|---|
| 2023 ජනවාරි 03 | අංශ/ශාඛා අතර ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම |
| 2023 ජනවාරි 10 | අංශ/ශාඛා අතර ස්ථාන මාරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය |
| 2023 ජනවාරි 26 | අංශ/ශාඛා අතර ස්ථාන මාරු මණ්ඩලය රැස්වීම |
| 2023 පෙබරවාරි 10 | අංශ/ශාඛා අතර ස්ථාන මාරු තීරණ දැනුම් දීම/ අභියාචනා කැඳවීම |
| 2023 පෙබරවාරි 17 | අභියාචනා භාරගන්නා අවසාන දිනය |
| 2023 මාර්තු 14 | සමාලෝචන මණ්ඩලය රැස්වීම |
| 2023 මාර්තු 21 | සමාලෝචන තීරණ දැනුම් දීම |

**09.** අංශ/ශාඛා අතර ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම.

I. අංශ/ශාඛා අතර ස්ථාන මාරු කමිටු මඟින් ලබා දෙන තීරණ අංශය භාර මාණ්ඩලික නිලධාරියා වෙත දන්වනු ලැබේ. එම තීරණ සම්බන්ධයෙන් අගතියට පත් වූ නිලධරයන්ට අදාළ තීරණ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සම්බන්ධයෙන් අභියාචනා යොමු කළ හැක.

II. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය තම අංශ ප්‍රධානියා වෙත ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. ඉහත වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණය සමාලෝචන කමිටුව විසින් ගනු ලබන අතර නිලධරයෙකුට එම අභියාචනා පිළිබඳ ගනු ලබන තීරණ සම්බන්ධයෙන් නැවත අභියාචනා යොමු කළ නොහැක.

IV. ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් වන අධ්‍යාපන ලේකම් ලෙස මාගේ තීරණය අංශ/ශාඛා ප්‍රධානී වෙත හා සෘජුවම අභියාචක වෙත දන්වනු ලැබේ.

අත්/ කළේ : එම්.එන්. රණසිංහ
අධ්‍යාපන ලේකම්

ආර්.බී. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)

දිනය : 2023.01.

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉසුරුපාය පරිශ්‍රයේ අංශ/ශාඛා අතර ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත්‍රය**

(2023 වාර්ෂික ස්ථාන මාරු, 2023 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සහ වෙනත් ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධාරීන් මෙම අංශ/ශාඛා අතර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් නොකළ යුතුය.)

1. නිලධාරියාගේ නම - ..........................................................................................

2. තනතුර - .............................................................. ශ්‍රේණිය - ..........................................

3. තනතුර අයත් සේවාව - ..........................................................................................

4. අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයට වාර්තා කළ දිනය - ..................................................

5. සේවා විස්තර (අධ්‍යාපන අමාත්‍යාංශය තුළ)

| අංශය | සේවා කාලය (............ සිට .........දක්වා) | වසර ගණන |
|---|---|---|
| | | |
| | | |
| | | |
| එකතුව | | |

6. ස්ථාන මාරුවීම සඳහා ඉල්ලුම් කරන අංශ/ශාඛාවන්

   1. ..............................................................................
   2. ..............................................................................
   3. ..............................................................................

7. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට ප්‍රකාශ කරමි.

.............................................................. ..........................................

නිලධාරියාගේ අත්සන දිනය

8. ශාඛාව භාර මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශය

..........................................................................................................................

9. අංශ ප්‍රධානිගේ නිර්දේශය

..........................................................................................................................
..........................................................................................................................

---

කාර්යාල ප්‍රයෝජනය සඳහා

ඉහත සඳහන් තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි.

.............................................................. ..........................................

විෂය භාර නිලධාරි අත්සන දිනය

.............................................................. ..........................................

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/සහකාර ලේකම්/පරිපාලන නිලධාරි දිනය